# ශුද්ධවූ සතියේ
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

ඉසයියස් දිවැස්ප්‍රසාදීතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි. ඉසයියස් 49 : 1 – 6

**මම ඔබ ජාතීන්ගේ ආලෝකය බවට පත් කරන්නෙමි.**

මුහුදුබඩ වැසියෙනි, මාසේ බස් අසන්න. ඈත සිටින ජනයෙනි මට සවන් දෙන්න. මා උපදින්නත් පෙර මව් කුසයෙහි සිටිය දී සමිඳාණෝ මා තෝරා ගෙන එතුමන්ගේ සේවකයා වන පිණිස මා පත් කළ සේක. එතුමාණෝ මාගේ වචන තියුණු කඩුවක් මෙන් කළ සේක. සිය අතේ සෙවණැල්ලෙහි මා ආරක්ෂා කළ සේක. එතුමාණෝ මා මුවහත් කළ ඊ ගසක් මෙන් කළ සේක. සිය කොපුවේ මා සඟවා තැබූ සේක. එතුමාණෝ කතා කොට ඉශ්රායෙල් නුඹ මගේ සේවකයා ය. නුඹ මගින් සෙනඟ මාගේ මහිමය ප්‍රකාශ කරනු ඇතැ”යි වදාළ සේක.

මම කතා කරමින් “මම නිකරුණේ වෙහෙසුණෙමි. මාගේ මුළු ශක්තිය යෙදූ නමුත්, කිසිවක් අත්පත් කර නොගතිමි”යි කීවෙමි. එසේ වුවද මාගේ විනිශ්චයය සමිඳුන් අතේ ඇති බවත් මාගේ විපාකය දෙවිඳුන් අතේ ඇති බවත් මට සහතික ය.

මා උපදින්නටත් පෙර තමන්ගේ සෙනඟ ආපසු ගෙනෙන පිණිසත් විසිර සිටින ඉශ්රායෙල් ජනයා ජාකොබ්ගේ වංශය එක් රැස් කරන පිණිසත් සේවකයකු වශයෙන් සමිඳාණෝ මා පත් කළ සේක. සමිඳාණෝ මට ගෞරවය දෙන සේක. එතුමාණෝ මාගේ ශක්තිය වන සේක. එතුමාණෝ මට මෙසේ වදාළ සේක. “ඉතිරිව සිටින ඉශ්රායෙල්වරුන් එනම් ජාකොබ් වංශයේ ජනයා නැඟිටුවා පුනරුත්ථාපනය කිරීමට මාගේ සේවකයා ලෙස නුඹ පත් කිරීම සුළුපටු දෙයක් නොවනු ඇත. එනම් මුළු ලොව ගලවනු පිණිස සියලු ජාතීන් හට නුඹ ආලෝකයක් වන්න මම සලස්වන්නෙමි.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 71 : 1-6, 15-17

පිළිතුර: සමිඳුනි ඔබේ සාධාරණ ක්‍රියා මා මුවින් ප්‍රකාශ කරමි.

අහෝ සමිඳුනි, සරණ පතා මම ඔබ වෙත පැමිණියෙමි.
කිසි කලෙක මා ලැජ්ජාවට පත් නොකළ මැනව. ඔබේ සාධාරණ කම නිසා මට පිහිට වී මා මුදාලුව මැනව. මට සවන් දී මා ගැළෙවුව මැනව.

ඔබ මාගේ පර්වතය ද බලකොටුව ද වන බැවින් ඔබ මට රැකවරණය දෙන පර්වතයක් වුව මැනව. මා මුදාලන බලකොටුවක් වුව මැනව.
මාගේ දෙවිඳුනි, දුෂ්ඨයන්ගේ බලයෙන් මා මුදා ගත මැනව. අපරාධකරුගේ ද සතුරාගේ ද ග්‍රහණයෙන් මා මිදුව මැනව.

මහෝත්තම දෙවි ස්වාමීනී, ඔබ මාගේ බලාපොරොත්තුව වන සේක. සමිඳුනි, මාගේ තරුණ වියේ සිට මාගේ විශ්වාසය මම ඔබ තුළ තැබුවෙමි.
උපන්දා සිට ඔබ මට පිහිට වූ සේක. මවු කුසේ සිට ඔබ මා රැකගත් සේක. මම ඔබ ගැන නිරතුරු ප්‍රශංසා කරන්නෙමි.

දවස පුරා ඔබේ සාධාරණ ක්‍රියා ද ඔබේ විමුක්තිදායක ක්‍රියා ද මා මුවින් ප්‍රකාශ කරමි. මන්ද මම ඒවායේ ප්‍රමාණය නොදන්නෙමි. දෙවි සමිඳුනි, ඔබේ බල මහිමය මම පසසන්නෙමි. ඔබේම එසේය ඔබේම යහපත්කම මම ප්‍රකාශ කරන්නෙමි. අනේ දෙවිඳුනි මාගේ තරුණ වියේ සිට ඔබ මට උගන්වා වදාළ සේක. මම අද දක්වා ඔබේ පුදුමාකාර ක්‍රියා වර්ණනා කළෙමි.

## සාධුකාරය

ඔබගේ පියාණන් හට කීකරු වී මැරීමට ගෙන යන අහිංසක බැටළු පැටවක මෙන් ඔබගේ කුරුසිය රැගෙන ගිය අපගේ රජාණෙනි, ඔබ වහන්සේට ප්‍රශංසා වේවා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**ජුවාම් 13 : 21-33, 36-38**

***ඔබ අතුරෙන් කෙනෙක් මා පාවා දෙති. ඔබ මා නොහඳුනති යි කියනු ඇත.***

ජේසුස් වහන්සේ මෙසේ පවසා බොහෝ සේ කැළඹී, "ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. ඔබ අතරෙන් කෙනෙක් මා පාවා දෙන්නේ ය"යි ප්‍රකාශ කළ සේක. උන් වහන්සේ එසේ කීමෙන් කවරෙකු අදහස් කළ සේක් දැ යි වියවුල් වූ ශ්‍රාවකයෝ එකිනෙකා දෙස බැලූහ. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් අතුරෙන් උන් වහන්සේ ප්‍රේම කළ තැනැත්තා උන් වහන්සේගේ ළයට හාන්සි වී සිටියේය. එබැවින් සීමොන් පේදුරු ඔහුට සංඥා කොට "උන් වහන්සේ කවරෙකු අදහස් කළ සේක් දැ යි කිව මැනැවැ" යි ඔහුට කීය. ඔහු ද සිටි ලෙසම ජේසුස් වහන්සේගේ ළයට තැඹුරු වී "ස්වාමිනි ඒ කවුරු දැ"යි ඇසීය. එවිට උන් වහන්සේ පිළිතුරු දෙමින් "මම රොටි කැල්ලක් පොඟවා යමෙකුට දෙම් ද ඒ ඔහු ය"යි වදාළ සේක. මෙසේ උන් වහන්සේ ඒ කැල්ල පොඟවා සීමොන් ඉස්කාරියොත්ගේ පුත් ජුදාස් ට දුන් සේක. ඔහ ූ ඒ කැල්ල අතට ගත් විට ඔහුට සාතන් ආවේශ වි. එවිට ජේසුස් වහන්සේ ඔහු අමතා "ඔබේ අදහස වහාම ඉටු කරන්නැ"යි වදාළ සේක. උන් වහන්සේ කුමක් නිසා මෙසේ වදාළ සේක්දැ යි කෑමට හිඳගත් අයගෙන් කිසිවෙක් තේරුම් නොගත්හ. ජුදස් පොදු මුදල් පසුම්බිය භාරව සිටි බැවින් මංගල්‍යයට වුවමනා දේ මිල දී ගන්න කියා හෝ දිළිඳුන්ට යමක් දෙන්න කියා හෝ ජේසුස් වහන්සේ ඔහුට වදාළ සේකැ යි සමහරු සිතූහ. ඔහු ඒ රොටි කැල්ල අතට ගත් පසු නොපමාව පිටතට ගියේය. එය රාත්‍රි කාලය විය.

ජුදස් පිටතට ගිය කල ජේසුස් වහන්සේ කතා කොට "දැන් මනුෂ්‍ය පුත්‍රයාණන් මහිමයට පැමිණ ඇත. එතුමාණන් තුළින් දෙවියන් වහන්සේ ද මහිමයට පැමිණි සේක් නම් දෙවියන් වහන්සේ තමන් තුළින් ඔහු ද මහිමයට පමුණුවන සේක. එය වහාම කරන සේක. දරුවෙනි, මා ඔබ සමඟ සිටින්නේ තව ටික වේලාවක් පමණෙකි. ඔබ මා සොයනු ඇත. එහෙත් මා ජුදෙව්වරුන්ට කීවාක් මෙන් දැන් ඔබටත් කියමි. මා යන තැනට ඔබට පැමිණිය නොහැක.

සීමොන් පේදුරු කතා කොට, “ස්වාමිනි, ඔබ කොතැනට වඩින සේක්දැ”යි ඇසීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් “මා යන තැනට ඔබට දැන් පැමිණිය නොහැකිය. එහෙත් පසුව ඔබ පැමිණෙනු ඇතැ”යි වදාළ සේක. පේදුරු උන් වහන්සේ අමතා “ස්වාමිනි දැන්ම ඔබ අනුව එන්න මට බැරි මන්ද? ඔබ නිසා මගේ දිවි පුදමි”යි කීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් “ඔබ මා නිසා ඔබේ දිවි පුදන්නෙහි ද? ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. කුකුළා හඬලන්නට පෙර ඔබ මා නොහඳුනති යි තුන් වරක් කියනු ඇතැ”යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය.

ශුද්ධවූ සතියේ